# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.21 පැය 0600 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/702/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>**

## 01. මනුෂ්‍ය ඝාතනයක් - පේදුරුතුඩුව පොලිස් වසම.

2025.04.20 වන දින උදෑසන කාලයේ පේදුරුතුඩුව පොලිස් වසමේ තුම්පලේ ප්‍රදේශයේ නිවසක හිසේ තුවාල සහිතව කාන්තාවක් මියගොස් ඇති බවට පේදුරුතුඩුව පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 69 ක් වූ තුම්පලේ, පේදුරුතුඩුව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකාරිය තම නිවසේ මුල්තැන්ගෙයි සිටියදී, ගෙවල් බිඳ දේපල සොරකම් කිරීම සඳහා පැමිණි පුද්ගලයෙකු විසින් පොල්ලකින් පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවට විමශර්න නිලධාරීන් විසින් අනාවරණය කරගෙන ඇති අතර ඝාතනය සම්බන්ධයෙන් **වයස අවුරුදු 20 ක් වන පේදුරුතුඩුව ප්‍රදේශයේ පදිංචි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

පශ්චාත් මරණ පරීක්ෂණයෙන් පසු මෘත ශරීරය ඥාතීන්ට භාර දී ඇත. පේදුරුතුඩුව පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - කොළඹ මධ්‍යම කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශය.

2025.04.20 වන දින අළුයම් කාලයේ මරදාන පොලිස් වසමේ ස්ටොක්වත්ත ප්‍රදේශයේදී කොළඹ මධ්‍යම කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 04 මිලිග්‍රෑම් 370 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 41 ක් වන කොළඹ 10 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරුගෙන් සිදුකරන ලද වැඩිදුර ප්‍රශ්න කිරීම්වලදී එදිනම අළුයම් කාලයේ මරදාන පොලිස් වසමේ මාලිගාකන්ද පාර ප්‍රදේශයේදී **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 09 මිලිග්‍රෑම් 260 ක් සන්තකයේ තබා ගෙන සිටි තවත් සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 39 ක් වන කොළඹ 10 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරුවන් දෙදෙනා මරදාන පොලිස් ස්ථානයට නඩු භාණ්ඩද සමඟින් ඉදිරිපත් කර ඇත. මරදාන පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2025.04.20 වන දින රාත්‍රී කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ෆගරීයුෂන් මාවතේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 600 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 53 ක් වන කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 04. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය.

2025.04.20 වන දින දහවල් කාලයේ කිරිබත්ගොඩ පොලිස් වසමේ බෞද්ධ මන්දිරය ඉදිරිපිට බස්නැවතුම්පොල අසලදී බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 29 ක් වන යාගොඩමුල්ල, කොටුගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු 2025.02.07 වන දින මිනුවන්ගොඩ පොලිස් වසමේ වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් කිරීමේ අපරාධයට ආධාර අනුබල දීම, සත්‍ය වසන් කිරීමේ චෝදනා සඳහා අවශ්‍ය කර සිටි පුද්ගලයෙකු වේ. බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**